**හෙලන්කො හොටෙල් ඇන්ඩ් ස්පා පෞද්ගලික සමාගම - 2018**

**--------------------------------------------------------------------------------**

**1.1 මතය**

හෙලන්කො හොටෙල් ඇන්ඩ් ස්පා පෞද්ගලික සමාගමේ ("සමාගම") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**කරුණක් අවධාරණය කිරීම**

මාගේ මතය තත්ත්වාගණනය නොකරමින්, පහත සඳහන් සටහන් කෙරෙහි අවදානය යොමු කරමි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ උපකල්පනය දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් 2.5. ඉහත සටහනේ දක්වා ඇති පරිදි, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හම්බන්තොට හෝටලය ඉදිකිරීම අත්හිටුවීම සඳහා යෝජනාවක් සම්මත කරගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ හෝටලය ඉදිකිරීමේ ක්‍රියාකාරකම් අත්හිටුවා ඇත. තවද අංක 17/1613/733/029 දරන 2017 අගෝස්තු 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කැන්විල් හොල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම(මව් සමාගම) හි කොටස් හිමිකාරිත්වයට සමානුපාතික වන ලෙස එහි කොටස් හිමියන් වෙත සමාගමේ කොටස් සංඛ්‍යාව පැවරීමට රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශය මගින් උපදෙස් ලබා දී තිබුණි. වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන ස්වාධීන තක්සේරුව මත පදනම්ව හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් හි කැන්විල් හොල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම ("සමාගම") අත්පත් කරගෙන තිබෙන කොටස් පැවරිය යුතුය. එම නිසා අපේක්ෂා කල හැකි අනාගත කාලයකදී සමාගම ඈවර කිරීමට යෝජනාවක් සම්මත කරගෙන නොමැත. එම නිසා අඛණ්ඩ පැවැත්මේ උපකල්පනය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා

ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 31,848,469 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 63,498,793 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 31,650,323 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මූල්‍ය ආදායම රු.49,061,948 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වර්ෂ තුන සඳහා පරිපාලන වියදම් සහ ශුද්ධ ලාභය/අලාභය පහත දැක්වේ.

| වර්ෂය | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| පරිපාලන වියදම් | 6,415,871.75 | 7,354,114.56 | 18,926,521.15 | 10,497,440.00 |
| බදු පසු ශුද්ධ ලාභය | 31,848,469.34 | 63,498,793.11 | 227,498,057.00 | 95,160,112.12 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට සපයන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සමඟ සසඳන විට සමහර වැදගත් අනුපාත පහත දැක්වේ.

| අනුපාත | 2018 | 2017 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 66.07 | 45.60 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 66.06 | 45.60 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය | 6.35 | 13.26 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) ඉඩම-හම්බන්තොට<br>මෙම ඉඩමේ පිහිටා ඇති වැට දිරාපත්ව ගොස් ඇති අතර නැවත ඉදිකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | නිරීක්ෂණය සමග එකඟ වේ.<br>යෝජිත හෝටල් ව්‍යාපෘතිය ඉදිකිරීමේ තීරණය සමාගම තීන්දුකර නොමැති නිසා ඉඩමේ මායිම් වැට නැවත ඉදිකිරීම උචිත නොවන බවට සමාගමේ කළමනාකාරණය මතයක සිටී. | මේ සම්බන්ධයෙන් ඉක්මනින් තීරණයක් ගත යුතුය. |
| ආ) මීට අමතරව, 2019 ජනවාරි 19 වන දින සමාගමේ කලමනාකාරිත්වයේ අවසරයකින් තොරව තුන්වන පාර්ෂවයක් විසින් යන්ත්‍ර භාවිතා කරමින් ඉඩම (වර්ග අඩි 6000 ක් පමණ) පවිත්‍ර කොට ඇත. | පරිශ්‍රෙයේ එවනි පවිත්‍ර කරන ලද ඉඩ ප්‍රමාණයන් කල්බදු සමාගම යටතේ පමිණිය හැකි අතර කෙසේ වුවත් එය පුහුදිලි නැත. මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් නාගරික සංවර්ධන අධිකාරියට, කල්බදු දෙන්නා සහ හම්බන්තොට පොලිස් ස්ථානයට කර ඇත. | මෙම කරුණ නිරාකරණය කර ගැනීමට ඉක්මන් පියවර ගත යුතුය. |
| ඇ) සමාගම රු.8,943,601 ක් වැට සඳහා ප්‍රාග්ධනිත කර ඇත. නමුත් 10% ක ප්‍රමාණයක් පමණක් සම්පූර්ණ කර ඇත. තවද සමහර අමානෝ තහඩු ඉවත් කර හා කබල් වී ඇත. | නිරීක්ෂණය සමග එකඟ වේ.<br>දහවල් කාලය සඳහා එක් නිලධාරීයෙක් සහ රාත්‍රි කාලය සඳහා නිලධාරීන් දෙදෙනෙකු වත්කමේ ආරක්ෂාව සඳහා ආරක්ෂක නිලධාරීන් පරිශ්‍රයේ යොදවා තිබුණ ද එය ප්‍රමාණවත් නොවේ. | පරිශ්‍රයේ ආරක්ෂාව වැඩි කිරීමට සහ නියම මුදල ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතුය. |
| ඈ) ඉඩමේ පිහිටි ගොඩනැගිලි හතරකට නිදහසේ ඕනැම පුද්ගලයෙකුට ඇතුළු වීමේ හැකියාව ඇත. | නිරීක්ෂණය සමග එකඟ වේ.<br>ඉහත සඳහන් අදහස් දැක්වීම වේ. | පරිශ්‍රයේ ආරක්ෂාව වැඩි කිරීමට පියවර ගත යුතුය. |

### 3.2 ගිවිසුම් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම රු.400,000,000 ක කෙටි කාලීන ණයක් සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා සමාගමට, නැවත ගෙවීම සහ පොලී ගණනය කිරීම සඳහා වූ ලිඛිත ගිවිසුමකින් තොරව ලබා දී ඇත. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, සමාගමේ කොටස්කරුවන්ගේ චක්‍රලේඛ සම්මතය සහ ගරු පොදු ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව 2017 ඔක්තොම්බර් 20 දින රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයේ ලේකම්ගේ ලිපිය යටතේ ඉහත කී ණය ලබා දී ඇත. | ලිඛිත ගිවිසුමක් ඇති කර ගැනීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම සම්බන්ධයෙන් 2003 ජුනි 02 වැනි දින රාජ්‍ය ව්‍යසාය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක PED/12 සමඟ සමාගම අනුකූල වී නොමැත. | අදහස් දැක්වීම සමඟ එකඟ වේ. ව්‍යාපෘතියේ යෝජිත ක්‍රියාකාරකම් නවතා තිබීමේ හේතුවෙන තවදුරටත් මහපෙන්වීම් රාජ්‍ය අධිකාරීන් විසින් තවදුරටත් මහපෙන්වීම් සිදු කරන තුරු සංයුක්ත සැලැස්මක් වැඩි දියුණු කරනු නොලැබේ. | චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |